**ශීර්ෂය 164 - දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය**

---

ශීර්ෂය 164 - දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.1 ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම පිළියෙළ කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 55.94 ක් වූ අතර සමාලෝචිත කාලපරිච්ඡේදය අවසාන වන විට ඉන් රු. මිලියන 39.04 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 16.90 ක් හෙවත් සියයට 30.21 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 31.07 | 18.61 | 12.46 | 40.10 |
| මූලධන | 24.87 | 20.43 | 4.44 | 17.85 |
| **එකතුව** | **55.94** | **39.04** | **16.90** | **30.21** |

**2.2 විගණන නිරීක්ෂණය**

------------------------

දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2015දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 විගණන සාක්ෂි නොවීම**

-----------------------------

වැය ඇස්තමේන්තු, කාර්ය සාධන වාර්තා ආදි වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශය විසින් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.18,000,000 කට අදාළ වූ ගනුදෙනු 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.3 විසර්ජන ගිණුම**

-------------------

**3.3.1 අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 17 ක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන නිසි ලෙස උපයෝජනය නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 ක සිට සියයට 93 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 19 ක් සඳහා සලසා තිබුණු රු.7,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ වියදම් දෙසැම්බර් මාසයේ ගිණුම් සරාංශයෙන් හා පරිපූරක ගිණුම් සාරාංශයකින් ශීර්ෂය 164 යටතේ ගිණුම්ගත කර තිබුණි. ගෙවීම් වවුචර් 165 ක පුනරාවර්තන වියදම් ගනුදෙනු එක් එක් වැය විෂයයන්වල ගිණුම් ගත කර තිබුණද, ගෙවීම් වවුචර්වල හෝ මුදල් පොතේ වැය විෂයයන් නිවැරදිව සඳහන් කර නොතිබීම නිසා එම වැය විෂයයන්වල ඉහත වියදම් ගිණුම් ගත කිරීම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ඩී.ජී.එස්.ඒ - 04 ආකෘතියට අනුව මූලධන වැය විෂයයන් මගින් වර්ෂය තුළ ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වල සහ ගොඩනැගිලි ඉදිකිරීම්වල මුළු එකතුව රු.11,431,366 ක් වුවද, ජංගම නොවන සංචලන වාර්තාවට අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම ලෙස රු.12,673,675 ක් ලෙස දක්වා තිබුණි.

## 3.5 නිෂ්කාර්ය වියදම්

අමාත්‍යාංශය 2015 සැප්තැම්බර් 21 දින සිට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය සමග ඒකාබද්ධ කර තිබුණද, අමාත්‍යාංශයේ කාර්යාල පරිශ්‍රය අභ්‍යන්තර කොටස් සැකසීම, කාර්යාල ලී බඩු මිලදී ගැනීම සහ මාසික ගොඩනැගිලි කුලී වශයෙන් එකතුව රු.15,571,365 ක මුදලක් එම ඒකාබද්ධ කිරීමෙන් පසුවද ශීර්ෂය 164 දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් 2015 වර්ෂයට අදාළ කාලපරිච්ඡේදය වෙනුවෙන් අමාත්‍යාංශය පවත්වා ගෙන යාම සඳහා ඉහතින් දක්වා ඇති පරිදි රුපියල් මිලියන 15 කට වැඩි මුදලක් වැය කර තිබුණද, එය ඵලදායි නොවන නිෂ්කාර්ය වියදමක් වන බව විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 04 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 11 | 05 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 15 | - | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 03 | 17 |
| | **එකතුව** | **58** | **12** | **36** |